(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 91.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2019 අගෝස්තු 23 වැනි සිකුරාදා පූ.භා. 10.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා

ගරු **වජිර අබේවර්ධන මහතා,** අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන විශේෂ ප්‍රදේශ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජේ. සී. අලවතුවල මහතා,** අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රංජිත් අලුවිහාරේ මහතා,** සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **බුද්ධික පතිරණ මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත සේනානායක මහතා,** විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එඩ්වඩ් ගුණසේකර මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **මහින්ද අමරවීර මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **ලසන්ත අලගියවන්න මහතා**

ගරු **ආනන්ද අලුත්ගමගේ මහතා**

ගරු **(ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා**

ගරු **ටී. බී. ඒකනායක මහතා**

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා**

ගරු **වේලු කුමාර් මහතා**

ගරු **නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා**

ගරු **කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**

ගරු **පියසේන ගමගේ මහතා**

ගරු **සිරිපාල ගමලත් මහතා**

ගරු **උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**

ගරු **නිහාල් ගලප්පත්ති මහතා**

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු අනුරාධ ජයරත්න මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු එස්. බී. නාවින්න මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු මුහම්මදු නසීර් මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු **සී. බී. රත්නායක මහතා**

ගරු **ඉෂාක් රහුමාන් මහතා**

ගරු **මුජිබුර් රහුමාන් මහතා**

ගරු **චමල් රාජපක්ෂ මහතා**

ගරු **මහින්ද රාජපක්ෂ මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **ගාමිණී ලොකුගේ මහතා**

ගරු **ජානක වක්කුඹුර මහතා**

ගරු **විදුර වික්‍රමනායක මහතා**

ගරු **ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා**

ගරු **රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**

ගරු **ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**

ගරු **චමින්ද විජේසිරි මහතා**

ගරු **ඩුලිප් විජේසේකර මහතා**

ගරු **හේෂා විතානගේ මහතා**

ගරු **තේනුක විදානගමගේ මහතා**

ගරු **එස්. ශ්‍රීතරන් මහතා**

ගරු **ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**

ගරු **ජයන්ත සමරවීර මහතා**

ගරු **සන්දිත් සමරසිංහ මහතා**

ගරු **ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

ගරු **තිලංග සුමතිපාල මහතා**

ගරු **එම්. ඒ. සුමන්තිරන් මහතා**

ගරු **මාවෛ සෝ. සේනාධිරාජා මහතා**

ගරු **සුනිල් හඳුන්නෙත්ති මහතා**

ගරු **විජේපාල හෙට්ටිආරච්චි මහතා**

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

ගරු **ඒ. එච්. එම්. ෆවුසි මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයාගේ නිවේදන** : කථානායකවරයා විසින් මතු පළවන නිවේදනය කරන ලදී,—

" 'ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීම) පනත් කෙටුම්පත' සලකා බැලීම පිණිස පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 113(2) ප්‍රකාරව ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට මතු පළ වන මන්ත්‍රීවරයන් අතිරේක සාමාජිකයන් වශයෙන් මවිසින් නම් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි:-

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු කනක හේරත් මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා"

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා විසින්—

(i) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.06.21 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ තෙවැනි වාර්තාවේ පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලයේ 2017 වර්ෂයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව; සහ

(ii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.06.21 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ තෙවැනි වාර්තාවේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ 2017 වර්ෂයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව

පිළිගන්වා, එම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.06.21 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ තෙවැනි වාර්තාවේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ 2017 වර්ෂයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව පිළිගන්වා, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාවරයා විසින්, 2016 වර්ෂය සඳහා මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී හි වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම :** (1) ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු විමල් රාජපක්ෂ මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) වෙළඳ නැව් (සංශෝධන) පනත් කෙටුම්පත;

(ii) 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය යටතේ නියමය; සහ

(iii) 2018 වර්ෂය සඳහා ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(2) කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු විජිත හේරත් මහතා වෙනුවෙන් එහි සාමාජික මන්ත්‍රී ගරු හේෂා විතානගේ මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) 2016 වර්ෂය සඳහා පොල් වගා කිරීමේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(ii) 2015, 2016 හා 2017 වර්ෂ සඳහා පොල් පර්යේෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තා; සහ

(iii) 2016 වර්ෂය සඳහා පොල් සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(3) රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා වෙනුවෙන් එහි සාමාජික ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය;

(ii) ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය අය කර ගැනීම සම්බන්ධ යෝජනා සම්මතය නිශ්චය කිරීම; සහ

(iii) විගණකාධිපති ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න මහතාගේ වැටුප සම්බන්ධ යෝජනා සම්මතය නිශ්චය කිරීම

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**4. මහජන පෙත්සම් පිළිගැන්වීම :**

(1) (i) කැලණිය, වරාගොඩ පාර, අංක 359/12 දරන ස්ථානයෙහි පදිංචි සී. ආර්. ඩී. පෙරේරා මහතාගෙන් ලැබුණු 2019.06.19 දිනැති පෙත්සම;

(ii) කොළඹ 5, ජාවත්ත පාර, අංක 99/1, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ පාලන අංශයේ සේවය කරන සී. ආර්. ඩී. පෙරේරා මහතාගෙන් ලැබුණු 2019.06.19 දිනැති පෙත්සම;

(iii) හෝමාගම, දියගම, තෝරමුල්ල, අංක 7/19 දරන ස්ථානයෙහි පදිංචි ඩී. ඒ. එම්. සී. රූපසිංහ මහතාගෙන් ලැබුණු 2019.06.13 දිනැති පෙත්සම; සහ

(iv) කඩුවෙල, මල්වත්ත පාර, අංක 474 දරන ස්ථානයෙහි පදිංචි සිරිපාල රත්නායක මහතාගෙන් ලැබුණු 2019.07.03 දිනැති පෙත්සම

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා විසින් පිළිගන්වන ලදී.

(2) කොළඹ 05, මන්ත්‍රී පෙදෙස, අංක 03 දරන ස්ථානයෙහි පදිංචි මහේන්ද්‍ර වී. විජේතිලක මහතාගෙන් ලැබුණු 2019.06.24 දිනැති පෙත්සම ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා විසින් පිළිගන්වන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 30(10) යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. ශෝක ප්‍රකාශ යෝජනා** : රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා විසින්, අභාවප්‍රාප්ත පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සාලින්ද දිසානායක මහතා, පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව ඉදිරිපත් කරන ලදී.

(පූ. භා. 11.47 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

"ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය යුතුය"යි, ගරු ගාමිණී ලොකුගේ මහතා, ගරු ටී. බී. ඒකනායක මහතා විසින් ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 1.46 ට ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.)

"ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා මූලාසනාරූඪ විය යුතුය"යි, ගරු ටී. බී. ඒකනායක මහතා, ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා විසින් ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.50 ට ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා මූලාසනාරූඪ විය.)

"ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ විය යුතුය"යි, ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.37 ට ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ වූවාය.)

(අ. භා. 4.57 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සාලින්ද දිසානායක මහතාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම කරන ලද ශෝක යෝජනාවන් අනුමත කරමින් කථානායකවරයා සමඟ ඊට එක් වූ නියෝජ්‍ය කථානායකවරයා මෙම යෝජනාවට සම්බන්ධ දිනට නියමිත පාර්ලිමේන්තු

විවාද නිල වාර්තාවේ (හැන්සාඩ්) පිටපත ශෝකයට පත් පවුලේ අය වෙත යවන ලෙස පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට නියෝග කරන ලදී.

**6. කල් තැබීම (අධිසේවක පදනම මත පත් කළ විදුහල්පතිවරුන් ස්ථිර විදුහල්පති සේවයට අන්තර්ග්‍රහණය කිරීම) :** ''මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය''යි ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ.භා. 5.07 ට, 2019 සැප්තැම්බර් 03 වැනි අඟහරුවාදා අ. භා. 1.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.